# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

105 – 5th Lane, Colomo – 03, Sri Lanka

Tel: +94 11 2564404, +94 11 5621886, +94 11 5621904 Fax: +94 11 4722632


## මධ්‍යම සහ වයඹ පළාත් සභා මැතිවරණය

**මාධ්‍ය නිවේදන අංක - 08**

**12.30 පැය**

**2009 පෙබරවාරි 21**

## නායක්කර්වෙනෙයි දෙමළ විද්‍යාල ඡන්ද මධ්‍යස්ථානයේ නැවත ඡන්දය විමසීම

පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ඡන්ද කොට්ඨාශයේ නායක්කර්වෙනෙයි දෙමළ මහා විද්‍යාල ඡන්ද මධ්‍යස්ථානයේ (ඡන්ද මධ්‍යස්ථාන අංක 47) නැවත ඡන්ද විමසීම අද දින පෙරවරු 7.00 ට ආරම්භ විය. මෙම නැවත ඡන්ද විමසීමේ කටයුතු නිරීක්ෂණය සඳහා මැ.ප්‍ර.නි.ම. ස්ථානගත ඡන්ද නිරීක්ෂයෙක් හා ජංගම ඡන්ද නිරීක්ෂණ කණ්ඩායමක් යොදවා ඇත. අදාල ඡන්ද මධ්‍යස්ථානයේ 1195 ක් පමණ වන ලියාපදිංචි ඡන්ද දායකයන්ගෙන් 62% ක පමණ ප්‍රමාණයක් (741) ප.ව. 2.00 වන විට ඡන්දය ප්‍රකාශ කර තිබුණි.

මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ වාර්තාවලට අනුව ඡන්ද අපේක්ෂකයන් හා ආධාරකරුවන් විශාල වශයෙන් එක්රොක් වී සිටීම නිසා ඡන්ද මධ්‍යස්ථානය අවට යම් නොසන්සුන්කාරී ස්වාභාවයක් පවතින අතර පොලිස් නිළධාරීන්ද ඉතා විශාල පිරිසක් ඡන්ද මධ්‍යස්ථානය හා ඒ අවට (මීටර් 500 ක ඡන්ද මධ්‍යස්ථාන සීමාවෙන් ඔබ්බෙහි) රාජකාරියෙහි යොදවා ඇත. ඊට අමතරව කඳුළු ගැස්වලින්ද සමන්විත විශේෂ පොලිස් කණ්ඩායමක් ඡන්ද මධ්‍යස්ථානයේ සිට මීටර් 500ක් ඔබ්බෙන් රඳවා ඇත.

මාධ්‍යවේදීන්ට ඡන්ද මධ්‍යස්ථානයට ඇතුලු වීමේ අවසරය නොලැබුණ අතර ඊට අදාළ අවසරය ලබාදීමේ නිෂේධ බලය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා සතුය.

**ඡන්ද දායකයන් ප්‍රවාහනය කිරීම**

මැ.ප්‍ර.ක්‍රි.නි. මධ්‍යස්ථානයේ මැතිවරණ නිරීක්ෂකයන් වාර්තා කළ පරිදි වාහන මගින් ඡන්ද දායකයන් ප්‍රවාහණය එ.ජ.නි.ස. ආධාරකරුවන් විසින් සිදු කර ඇති අතර ඩොල්පින් වර්ගයේ සුදු පැහැති වෑන් රථය මගින් (අංක 62-5427) එලෙසින් ඡන්ද මධ්‍යස්ථානය වෙත ඡන්ද දායකයන් ප්‍රවාහණය කිරීම සිදු කර ඇත. එහි නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් නම් එ.ජ.නි.ස. අපේක්ෂකයාගේ (මනාප අංක 16) කොඩියක් දක්නට තිබී ඇත. මැ.ප්‍ර.ක්‍රි.නි.ම. ට වාර්තා වන පරිදි අදාල වෑන් රථයේ රියදුරා හට පොලිසිය අවවාද කිරීමෙන් අනතුරුව එම රථය හා සියලු ලිපිලේඛන පොලිස් භාරයට ගෙන ඇත.

එම රථය ජන්ද මධ්‍යස්ථානය අසල පෙ.ව. 09.12 සිට ප.ව 12.15 දක්වා රඳවා ගැනීමෙන් අනතුරුව පොලිසිය විසින් නිදහස් කරන ලදි. අදාළ සිදුවීම සම්බන්ධව මැ.ප්‍ර.නි.ම. සහකාර පොලිස් අධිකාරි අයි.බී.ටී සුගතපාල මහතාගෙන් විමසූ අවස්ථාවේ දී අදාළ වෑන් රථයේ රියදුරු වෙත අවවාද කිරීමෙන් අනතුරුව එම රථය වහා ඉවත්කල බව ඔහු විසින් සනාථ කරන ලදි. තවද මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂනය කළ පරිදි මීටර් 500 ක් ඔබ්බෙන් එ.නි.ස. අපේක්ෂක අමල් චින්තක මායාදුන්නගේ (මනාප අංක 05) අංකය සඳහන් ස්ටිකර් සහිත ක්‍රීම් පැහැති කැබ්රථය (51-3189) මේවන විටත් ජන්ද දායකයන් ප්‍රවාහනය කරනු මැ.ප්‍ර.නි.ම. ට නිරීක්ෂණය විය.

**වෙනත් සිදුවීම්**

එ.ජ.නි.ස. අපේක්ෂයන් වන අමල් චින්තක මායාදුන්න (මනාප අංක 05) Suzuki Swift වර්ගයේ කාරයකින් ද, (NW KS - 3313) තම්බි මරිකාර් මොහමඩ් තාහිර් (මනාප අංක 16) ඩබල් කැබ් වර්ගයේ රථයකින් ද (WP PE - 6733) තම අංක සහිත ස්ටිකර් ප්‍රදර්ශණය කරමින් ජන්ද මධ්‍යස්ථානය සමීපයේ සැරිසරනු නිරීක්ෂණය වු අතර ජන්දය භාවිතා කිරීම සඳහා එක්නොවන්නා වු විශාල පිරිසක් ජන්ද මධ්‍යස්ථානය අවට ප්‍රදේශයක් වන කරඹ, නායක්කර්වේනයි හන්දියේ එක්රොක්වෙමින් සිටිනු මැ.ප්‍ර.ක්‍රි.නි.ම. නිරීක්ෂණය විය.

ජන්දය පැවැත්වෙන කාලය අතරතුර ජන්ද ව්‍යාපාරයේ නිරතවීම. දේශපාලන පක්ෂ මඟින් ජන්ද දායකයන් ප්‍රවාහනය කිරීම සහ ජන්ද ප්‍රතිපලයට බාධාවන පරිදි පිරිස් එක්රොක් වීම ආදි මතු සඳහන් කරන ලද සිද්ධීන් වැලැක්වීමට සුදුසු පියවර ගන්නා ලෙස මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටී. තවද නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කිරීමට කටයුතු කිරීම මැතිවරණ නිළධාරින්, පොලිසිය හා අපේක්ෂකයන් සතු වගකීම විය යුතු අතර ම වඩා වැදගත් වන්නේ කවර අයුරකින් හෝ මැතිවරණ ක්‍රියාවලියේ සුරක්ෂිත භාවයට අදාල ක්‍රියාවලිය ආරක්ෂා කිරීම හා ඊට බාධාකාරී ක්‍රියාවන් සඳහා ඉඩකඩ විවර නොකිරීමට ක්‍රියා කිරීම බව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය තවදුරටත් අවධාරණය කරයි.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV), 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (FMM) හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සංධානය විසින් පිහිටුවා ගනු ලැබුයේ ස්වාධීන හා පක්ෂවලට නොබැඳුනු සංවිධානයක් ලෙස මැතිවරණ ආශ්‍රිත ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ කිරීම අරමුණ කොටගෙනය. වර්තමානයේ මෙම මධ්‍යස්ථානය (CMEV), විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (FMM) හා INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන ආයතනවලින් සමන්විත වේ.

| | | |
|---|---|---|
| ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු | සුනිල් ජයසේකර | උදය කලුපතිරන |
| සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු |